

ආරක්ෂාව

# ආරක්ෂිත ආරක්ෂක පටි

**අපි එදිනෙදා ජීවිතයේ ගමනාගමනය සඳහා කවර හෝ වාහනයක් යොදා ගනිමු. වාහනයක ගමන් කිරීමේ දී අසුන් පටි පැළඳීමෙන් ලැබෙන ආරක්ෂාව ගැන ඔබ දන්නවා ද ? අවාසනාවකට මෙන් ශ්‍රී ලංකාවේ රියැදුරන් සහ මගීන් ආසන පටි පැළඳිය යුතු බවට තද නීති මෙතෙක් පනවා නැත.**

මෙරටට ගෙන්වනු ලබන බොහොමයක් වාහනවල මේවා ඇතත් පාවිච්චි කරන අය ඉතා විරල වේ. ඇමරිකාවේ රැස් කරන ලද දත්ත දෙස බලන විට මෙහි වටිනාකම මොනවට පැහැදිලි වෙයි.

1996 වසරේ අමෙරිකාවේ රිය අනතුරුවලට මුහුණ පා මිය ගිය රියදුරන්ගෙන් සියයට 63 ක් ආසන පටි පැළඳ නොසිටියහ.

රියදුරන්ගෙන් සියයට 90 ක් ආසන පටි පැළඳ සිටියා නම් එක් වසරක් තුළ ජීවිත 5500 ක් බේරා ගතහැකිව තිබූ අතර, 132,000 දෙනකු අංග විකල වීමෙන් වළක්වාලිය හැකිව තිබුණි. වයස 16 සිට 25 දක්වා තරුණයන් බීමත්ව රිය පැදවීම හා අධික වේගයෙන් රිය පැදවීම වැඩියෙන් යොමුවන නිසා ඔවුන් සියයට 50 ක් වැඩියෙන් රිය අනතුරුවලට ගොදුරු වෙති.

ඉදිරිපස අසුනේ දරුවන් වාඩිකරවාගෙන යාම නිසා ඔවුහු අනතුරට පත්වීමේ අවදානම ඉතාමත් වැඩිය. රියදුරුතැන ආසන පටි පළඳින්නේ නැති නම් දරුවනට පැළඳවීම සියයට 24 කට වැඩි නැත.

ශ්‍රී ලංකාවේ මාර්ගවල ධාවනය වන වාහන සියල්ලකම පාහේ ආසන පටි සවිකොට තිබේ. එහෙත් ඒවා පාවිච්චි නොකෙරේ. ඒවා භාවිතය ඔබගේ සහ ඔබ ආදරය කරන අන් අයගේත් යහපත සඳහාම වන නිසා නීතියෙන් බල කරන තෙක් නොසිට සැමවිටම ආසන පටි පැළඳීම අනිවාර්යයෙන් ම කළ යුතුය. ඒ සඳහා ගතවන්නේ තත්පර 10 ක් පමණි. එහෙත් කිසියම් අනතුරක් සිදුවුවහොත් සුවපත් වීමට මාස කිහිපයක් හෝ වසර ගණනක් ගතවිය හැකිය.

මේ රටේ වැඩිම මිනිසුන් සංඛ්‍යාවක් මරණයට පත් කරන්නේත්, අංග විකල වූවන් බවට පත් කරන්නේත්, රිය අනතුරු මිස දසක දෙකකට වැඩි කලක් පුරා දිවෙන යුද්ධයම නොවන බව සිහිකටයුතුය.

ජාතික මහාමාර්ග ගමනාගමන ආරක්ෂාව පිළිබඳ සංවිධානයේ නීති රීති අනුව, ආසනය මදක් පසුපසට කොට වාඩි විය යුතුය. ආසන පටි පැළඳිය යුතුය. දරුවන් පසු පස ආසනයේ වාඩි කරවිය යුතුය.

වෛද්‍ය

**හිමන්ත අතුකෝරාල**

